# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## තෙවන වාර පරීක්ෂණය - 2018

**පෙරදිග සංගීතය** | **12 ශ්‍රේණිය** | කාලය පැය තුනයි

**උපදෙස්**
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 50 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි හෝ ඉතාම ගැලපෙන පිළිතුර තෝරා ඊට අදාල අංකය ඉදිරියෙහි ඇති වරහන තුල ලියන්න.

1. දිවා දෙවන ප්‍රහරයෙහි ගායනය වාදනය වන රාග යුගලය වන්නේ
   i. දේශ් - ආශාවරි　　ii. ආශාවරී - භාගේශ්‍රී　　iii. දේශ් - භාගේශ්‍රී
   iv. ආශාවරී - ජොන්පුරි　　v. ජෞන්පුරි - දේශ්
   (………)

2. රි, ප වාදී, සංවාදී වන රාග යුගලය වන්නේ
   i. ජෞන්පුරි - ආශාවරි　　ii. දේශ් - ආශාවරී
   iii. දේශ්- තිලක්කාමෝද්　　iv. තිලක්කාමෝද් - ජෞන්පුරි
   v. භාගේශ්‍රී - ජෞන්පුරි
   (………)

3. සනිධස, මධනිධ, ම, ගරිස ……මුඛ්‍යාංගය ලෙස යෙදෙන රාගය කුමක්ද?
   i. භාගේශ්‍රී　　ii. ආශාවරි　　iii. තිලක්කාමෝද්
   iv. ජෞන්පුරි　　v. දේශ්
   (………)

4. පූර්වාංගවාදී රාග යුගලයක් වන්නේ
   i. ආශාවරි - ජෞන්පුරි　　ii. දේශ් - තිලක්කාමෝද්　　iii. ආශාවරී - දේශ්
   iv. භාගේශ්‍රී- ආශාවරී　　v. දේශ් - ජෞන්පුරි
   (………)

5. ආශාවරි රාගය සම්බන්ධ නිවැරදි කියමන වන්නේ
   i. ආශාවරි මේලයෙන් බිහිවේ, සම්පූර්ණ ජාති රාගයකි
   ii. භෛරවී මේලයෙන් බිහිවේ, ඖඩව සම්පූර්ණ ජාති රාගයකි
   iii. වාදි ස්වරය මධ්‍යමයයි. දිවා දෙවන යාමයේ ගායනය වේ
   iv. ආරෝහණයේ ග, නි වර්ජිතයි. රිෂභය වාදී ස්වරය වේ
   v. ආශාවරි මේලයෙන් බිහිවේ, ඖඩව සම්පූර්ණ ජාති රාගයකි
   (………)

6. ඛමාජ් මේලගත රාග යුගලය වන්නේ
   i. දේශ් - තිලක්කාමෝද්　　ii. දේශ් - ආශාවරී
   iii. දේශ් - භාගේශ්‍රී　　iv. තිලක්කාමෝද් - ආශාවරී
   v. ජෞන්පුරි - ආශාවරී
   (………)

7. ආශාවරී රාගයේ මුඛ්‍ය ස්වර සංගතිය කුමක්ද?

i. රි ම ප, නි ධ ප

ii. රි ම́ප, නි ධ̲ ප

iii. රි ම ප, නි̲ ධ̲ ප

iv. රි̲ ම ප, නි ධ̲ ප

v. රි̲ ම ප, නි̲ ධ̲ ප

(………)

8. ආරෝහණයේදී ගාන්ධාරය වර්ජවන ආශාවරී මේලගත රාගය කුමක්ද?

i. ආශාවරී

ii. ජෞන්පුරි

iii. තිලක්කාමෝදි

iv. දේශ්

v. භාගේශ්‍රී

(………)

9. සම ප්‍රකෘති රාග යුගලයකි

i. ජෞන්පුරි - දේශ්

ii. දේශ් - ආශාවරී

iii. භාගේශ්‍රී - ආශාවරී

iv. භාගේශ්‍රී - දේශ්

v. ආශාවරී - ජෞන්පුරි

(………)

10. ආශාවරී සහ ජෞන්පුරි රාගයන්හි සමානකමක් වනුයේ

i. ග̲, ධ̲ පිළිවෙලින් වාදී - සංවාදී ස්වර වීම

ii. පූර්වාංග වාදී රාගයන් වීම

iii. රාත්‍රී කාලයේ ගායනය වාදනය වීම

iv. උත්තරාංග වාදී රාගයන් වීම

v. ආරෝහණය ෂාඩව ජාති වීම

(………)

11. පෙරදිග සංගීතයට අනුව භාණ්ඩ වර්ගීකරණය වන්නේ

i. තත්, විතත, ඝන, සුෂිර යනුවෙනි

ii. තත්, ඝන, සුෂිර, අවනද්ධ යනුවෙනි

iii. ආතත, විතත, ඝන, සුෂිර යනුවෙනි

iv. තත්, සුෂිර, අවනද්ධ, සමාඝාත යනුවෙනි

v. ආතත, විතත, තත්, සුෂිර යනුවෙනි

(………)

12. භාරතීය සංගීතයේ දේශීය සංගීතය යනුවෙන් හඳුන්වන්නේ

i. කර්ණාටක හා දේශීය සංගීතයයි

ii. හින්දුස්ථානි හා මාර්ග සංගීතයයි

iii. හින්දුස්ථානි සංගීතය හා කර්ණාටක සංගීතයයි

iv. කර්ණාටක සංගීතය හා මාර්ග සංගීතයයි

v. හින්දුස්ථානි සංගීතය හා දේශීය සංගීතයයි

(………)

13. භාරතීය සංගීතයේ ප්‍රධාන කොටස් දෙක වනුයේ

i. කර්ණාටක සංගීතය සහ දේශීය සංගීතය යි

ii. හින්දුස්ථානි සංගීතය හා මාර්ග සංගීතය යි

iii. කර්ණාටක සංගීතය හා මාර්ග සංගීතය යි

iv. මාර්ග සංගීතය හා දේශීය සංගීතය යි

v. හින්දුස්ථානි සංගීතය හා උතුරු ඉන්දීය සංගීතය යි

(………)

14. තවත් ස්වරයක ආධාරයෙන් ස්වර චලනය කර අලංකාරවත්ව ගයන - වයන සංගීතමය ශිල්පාංගය කුමක්ද?

i. ගමක්

ii. කන්

iii. මීන්ඩ්

iv. ආලාප

v. තිහායි

(………)

15. උත්තර භාරතීය සහ දක්ෂිණ භාරතීය සංගීත පද්ධති පිළිබඳ නිවැරදි කියමන වනුයේ
   i. ඔපෙරා, සිම්පනි, සොනාටෝ ආදී නිර්මාණ ඇත
   ii. වන්නම්, පදම්, තිල්ලානා, ආදී ගායනා ශෛලීන් ඇත
   iii. ප්‍රධාන ස්වර වාද්‍ය භාණ්ඩ පිළිවෙලින් සිතාරය සහ වයලීනයයි
   iv. ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩ පිළිවෙලින් මෘදංගය සහ තබ්ලාවයි
   v. මේල සංඛ්‍යාව පිළිවෙලින් 10ක් සහ 72 කි.

(………)

16. දක්ෂිණ භාරතීය සංගීත පද්ධතියේ ප්‍රධාන මේලය කුමක්ද?
   i. චාරුකේෂි   ii. හරිකාම්බෝජ   iii. භවප්‍රිය
   iv. කරහර ප්‍රිය   v. මායා මාලගෞල

(………)

17. උත්තර භාරතීය සංගීතයේදී ගීත ආකෘතිය වනුයේ
   i. ස්ථායි, අන්තර, පල්ලවි, අන්පල්ලවි
   ii. ස්ථායි, පල්ලවි, අනුපල්ලවි, අභෝගි
   iii. පල්ලවි, අනුපල්ලවි, චිත්ත ස්වරම්, වර්ණම්, චරණ ස්වර
   iv. ස්ථායි, අන්තරා, සංචාරි, අභෝගි
   v. පල්ලවි, අනුපල්ලවි, සංචාරි, අභෝගි

(………)

18. ගායන ආකාරය මත සමානකමක් දක්වන ගායන ශෛලීන් දෙකකි.
   i. ඛ්‍යාල් - ධමාර්   ii. ධමාර් - භජන්   iii. ධ්‍රැපද් - ධමාර්
   iv. ධ්‍රැපද් - ඛ්‍යාල්   v. ධමාර් - ඛ්‍යාල්

(………)

19. දේවාල ආශ්‍රිතව ගොඩනැගුණු භක්ති රසයෙන් යුත් සරල ශාස්ත්‍රීය ගායන ශෛලියක් වන්නේ
   i. ඛ්‍යාල්   ii. භජන්   iii. ධ්‍රැපද්
   iv. ධමාර්   v. චතුරංග

(………)

20. තාලයේ නම මත පදනම්ව හැඳින්වෙන හින්දුස්ථානී ගායන ශෛලිය කුමක්ද?
   i. ධමාර්   ii. ඛ්‍යාල්   iii. චතුරංග
   iv. වර්ණම්   v. තිල්ලානා

(………)

21. අනාසාතාත්මකව ගැයෙන මෙහෙ ගී වර්ග තුනක් වන්නේ
   i. ගොයම් ගී, පතල් ගී, නෙළුම් ගී   ii. දරු නැළවිලි ගී, වරම් ගී, ගොයම් ගී
   iii. පතල් ගී, බඹර ගී, ටීකා සීපද   iv. දරු නැළවිලි ගී, බඹර ගී, වරම් ගී
   v. නෙළුම් ගී, ගොයම් ගී, වරම් ගී

(………)

22. "ඔසේ ගායනය" ලෙස හඳුන්වන්නේ
   i. ටීකා සී පද   ii. නෙළුම් ගී   iii. පතල් ගී
   iv. වරම් ගී   v. බඹර ගී

(………)

23. "බැද්දේ ගියා වැලක් හොයා ගන්ට කියා" යනුවෙන් ගැයෙන්නේ
   i. ටීකා සීපදයකි   ii. පතල් ගීයකි   iii. බඹර ගීයකි
   iv. නෙළුම් ගීයකි   v. දරු නැළවිලි ගීයකි

(………)

24. පතල් ගී සහ බඹර ගී වල දක්කට ලැබෙන සුවිශේෂ ලක්ෂණයකි

i. ආසාතාත්මකව ගායනය වීම  ii. සාමූහිකව ගායනය වීම

iii. ඇදහිලි හා විශ්වාසය මත පදනම්ව ගැයීම  iv. බුම්මැඩිය වයමින් ගැයීම

v. ඒකල ව (තනිව) ගැයීම

(………)

25. ජන ගී වර්ගීකරණයට අනුව මෙහෙ ගීයක් නොවන්නේ

i. නෙළුම් ගී  ii. ගොයම් ගී  iii. පතල් ගී

iv. ශාන්තිකර්ම ගී  v. බඹර ගී

(………)

26. නූර්ති සංගීතයේදී භාවිතාවන ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය කුමක්ද?

i. මෘදංගය  ii. තබ්ලාව  iii. ගැටබෙරය

iv. මද්දලය  v. පඛ්වාජය

(………)

27. ඉන්දියානු සංගීතඥ "විශ්වනාත් ලව්ජි" සංගීතයෙන් දයකවන නාට්‍ය විශේෂය වනුයේ

i. නව නාට්‍ය  ii. සොකරි  iii. කෝලම්

iv. නාඩගම්  v. නූර්ති

(………)

28. නූර්ති සංගීතයේ ගිත අකෘතිය වනුයේ

i. ස්ථායි - පල්ලවි  ii. අන්තරා - අභෝගී  iii. සංචාරී - අභෝගී

iv. ස්ථායි - අන්තරා  v. පල්ලවි - අනුපල්ලවි

(………)

29. රාගාශ්‍රිත නූර්ති ගී කීපයක් වනුයේ

i. සෝබමාන දේවපුරා, අපි කිරිල්ලියෝ, සුවඳ සබන් ඇඟ ගාලා

ii. රකිනු ඊශ්වරා, ප්‍රේමයෙන් මන, ගුමු ගුමුව වදුලේ

iii. ලෝනා මුනිරාජගේ, සෝබමාන දේව පුරා, අප ගුණසරු සිංහල

iv. රසුපති රාඝව, මඬේ ලගින තාරාවුන්, අන්න බලන් සඳ

v. ගල්ලෙන බිඳලා, ලෝනා මුනිරාජගේ, හනික වරෙව් කොල්ලනේ

(………)

30. නූර්ති නාට්‍ය සංගීතය හා සම්බන්ධ නිවැරදි කියමන වන්නේ

i. හින්දුස්ථානි සංගීතය ඇසුරු කරගනී, ස්වර වාද්‍ය ලෙස සර්පිනාව යොදගනී.

ii. තබ්ලාව තාල වාද්‍ය භාණ්ඩයයි, කර්ණාටක සංගීතය ඇසුරුකරගනියි.

iii. ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය මද්දලයයි, සර්පිනාවද යොද ගනී.

iv. දක්ෂිණ භාරතීය සංගීත අභාෂය ලබා ඇත. රාගාශ්‍රිත ගීත නිර්මාණය වී ඇත.

v. ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය තබ්ලාවයි. දේශීය සංගීතය ඇසුරු වී ඇත.

(………)

31. වයලීනයේ තත් සුසර කරන පෙරදිග ක්‍රමය වනුයේ

i. ප̣, රි, ප, ස̇  ii. ප̣, ස, ප̣, ස  iii. ස̣, ප̣, ස, ප

iv. ප̣, ස, ප, ස̇  v. ප̣, රි, ධ, ග

(………)

32. ම̣ ස ප රි̇ ලෙස වයලීනයේ තත් සුසර කරනුයේ

i. අපරදිග ක්‍රමයටයි  ii. පෙරදිග ක්‍රමයටයි  iii. කර්ණාටක ක්‍රමයටයි

iv. භාරතීය ක්‍රමයටයි  v. ව්‍යවහාරික ක්‍රමයටයි

(………)

33. වයලීන් පවුලේ සාමාජිකයන් සිව්දෙනා පිළිවෙලින්

i. වයලින්, වියෝලා, චෙලෝ, ඩබල්බේස්
ii. වයලින්, ඕබෝ, චෙලෝ, වියෝලා
iii. වයලින්, වියොලා, චෙලෝ, ත්‍රොම්බෝන්
iv. ඩබල්බේස්, චෙලෝ, ඕබෝ, වයලින්
v. වයලින්, ඩබල් බේස්, ඕබෝ, ක්ලැරිනට්

(.........)

34. ශ්‍රැති ස්වරය ලෙස C යෙදෙන C *minor* ස්කේලයට ගැයෙන ගීතයක ප්‍රධාන *chord* (කෝඩ්) ස්වර වනුයේ

i. C E G (ස ග ප)
ii. C $D^b$ G (ස රි ප)
iii. C $E^b$ G (ස ග ප)
iv. G $B^b$ D (ප නි රි)
v. F $A^b$ C (ස ග ප)

(.........)

35. අපරදිග සංගීතයට අනුව *Wind Insteument* (වින්ඩ් ඉන්ස්ට්‍රැමන්ට්) වනුයේ

i. ෆ්ලූට්, සැක්සෆොන්, චෙලෝ, ටියුබා
ii. ක්ලැරිනට්, ඕබෝ, ෆ්ලූට්, සැක්සෆෝන්
iii. පිකලේ, චෙලෝ, වියොලා, ත්‍රොම්බෝන්
iv. ඩ්‍රම්ස්, ට්‍රම්පට්, වියොලා, ටියුබා
v. පිකලෝ, ෆ්ලූට්, ක්ලැරිනට්, සැක්සෆොන්

(.........)

- **පහත දී ඇති තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක 36 සිට 42 දක්වා පිළිතුරු සපයන්න.**

1. F G A $B^b$ C D E F
2. C $E^b$ G
3. G B D
4. C D E F G A B C
5. G $B^b$ D
6. C E G
7. $B^b$ major ස්නේලය
8. ස රි ග ම ප ධ නි ස්
9. A B C D E F G A
10. F A C

36. "සිනිදු සුදුමුදු තලාවේ" ගීතයට යෙදෙන Chord ස්වර යෙදෙනුයේ

i. අංක 7
ii. අංක 6
iii. අංක 3
iv. අංක 5
v. අංක 2

(.........)

37. අංක 9න් දැක්වෙන්නේ

i. C *minor* ස්කේලයයි
ii. A *major* ස්කේලයයි
iii. A *minor* ස්කේලයයි
iv. F *minor* ස්කේලයයි
v. G *minor* ස්කේලයයි

(.........)

38. G Major ස්කේලයට අයත් ප්‍රධාන Chord එක පිහිටි අංකය වනුයේ

i. අංක 3
ii. අංක 2
iii. අංක 7
iv. අංක 6
v. අංක 10

(.........)

39. අංක 1 සහ අංක 8 පිළිවෙළින් දැක්වෙන්නේ

i. F *minor* සහ C *minor* ස්කේල
ii. F *major* සහ C *minor* ස්කේල
iii. F *minor* සහ C *major* ස්කේල
iv. F *major* සහ C *major* ස්කේල
v. F *major* සහ A *major* ස්කේල

(.........)

40. අංක 7 න් දැක්වෙන ස්කේලය ආරම්භවන ස්වරය වනුයේ

i. කෝමළ ධෛවතය ii. කෝමළ රිෂභය iii. ශුද්ධ නිෂාධය
iv. කෝමළ නිෂාධය v. තීව්‍ර මධ්‍යමය

(.........)

41. C $Major$ ස්කේලය සහ එහි ප්‍රධාන $Chord$ පිහිටන ස්වර හිමි අංක පිළිවෙලින්

i. අංක 4 සහ 6 ii. අංක 1 සහ 7 iii. අංක 4 සහ 2
iv. අංක 8 සහ 2 v. අංක 8 සහ 6

(.........)

42. අංක 5 න් දැක්වෙනුයේ

i. G $major\ chord$ එකයි ii. G $minor\ chord$ එකයි
iii. G $major$ ස්කේලයයි iv. C $minor$ ස්කේලයයි
v. $B^b\ major$ ස්කේලයයි

(.........)

43. “$The\ Silk\ Road$” ආදී නම් වලින් පරිගණකයම යොදා ගනිමින් සංගීත නිරමාණ කළ ජපන් සංගීතඥයා කවුද?

i. $Ravi\ Shankar$ (රවී ශංකර්) ii. $Beethovan$ (බිතෝවන්)
iii. $Kitaro$ (කිටරෝ) iv. $Morsart$ (මෝසර්ට්)
v. $Yani$ (යානි)

(.........)

44. තෝඩායම, ඉන්නිසය, පොතේ සින්දුව, උරුට්ටුව ආදී සංගීත අංග භාවිතවන නාට්‍ය විශේෂය කුමක්ද?

i. නූර්ති ii. කෝලම් iii. සොකරි
iv. නාඩගම් v. නවනාට්‍ය

(.........)

45. පිළිවෙලින් කමත, ශාලා වේදිකාව, කරලිය, තානායම් පොළ රංග භූමිය වන නාට්‍ය වනුයේ

i. නූර්ති, නාඩගම්, කෝලම්, නවනාට්‍ය ii. සොකරි, නූර්ති, කෝලම්, නාඩගම්
iii. නාඩගම්, කෝලම්, සොකරි, නූර්ති iv. සොකරි, නූර්ති, නාඩගම්, කෝලම්
v. කෝලම්, නූර්ති, නවනාට්‍ය, සොකරි

(.........)

46. මැදුම් මහ දෙතිතට සමාන හින්දුස්ථානි තාලය වනුයේ

i. දදරා ii. දීප්චන්දි iii. ජප් තාලය
iv. ත්‍රිතාලය v. කෙහෙර්වා

(.........)

47. අපරදිග $5_8$ $Time\ Signatute$ සඳහා සමානකම් දක්වන දේශීය තිත් රූපය විය හැක්කේ

i. මැදුම් මහ දෙතිත ii. මැදුම් තනිතිත iii. සුළු මැදුම් දෙතිත
iv. සුළු මහ දෙතිත v. මහ තනිතිත

(.........)

48. දෙතිතේ තිත් රූප ආඝාත වලට මාත්‍රා යෙදෙන අන්දම පිළිවෙලින් දැක්වෙන්නේ

i. මාත්‍රා 2/3 මාත්‍රා 4/4 මාත්‍රා 2/4
ii. මාත්‍රා 2/2 මාත්‍රා 3/3 මාත්‍රා 2/3
iii. මාත්‍රා 3/3 මාත්‍රා 3/4 මාත්‍රා 3/2
iv. මාත්‍රා 2/3 මාත්‍රා 2/4 මාත්‍රා 4/4
v. මාත්‍රා 2/3 මාත්‍රා 2/4 මාත්‍රා 3/4

(.........)

49. / 1 2 3 / 1 2 3 4 / 1 2 3 / 1 2 3 4

ඉහත මාත්‍රා පිහිටුමට අනුව දේශීය තිත් රූපයක තිත් සංඥා පිහිටිය යුත්තේ

i. / Λ / Λ / 1 / 1 / ලෙසින් ය

ii. / Λ / 1 / Λ / Λ / ලෙසින් ය

iii. / Λ / Λ / Λ / 1 / ලෙසින් ය

iv. / Λ / 1 / Λ / 1 / ලෙසින් ය

v. / Λ / 1 / 1 / 1 / ලෙසින් ය

(………)

50. දාදරා තාලයට හා ලාවණී තාලයට සමානව මාත්‍රා බෙදෙන දේශීය තිත් රූප පිළිවෙලින්

i. මැදුම් තනි තිත - සුළු තනි තිත

ii. මැදුම් තනි තිත - මැදුම් මහ දෙතිත

iii. මහ තනි තිත - සුළු තනි තිත

iv. සුළු මැදුම් දෙතිත - මැදුම් මහ දෙතිත

v. මැදුම් තනි තිත - සුළු මහ දෙතිත

(………)